# විදේශ විනිමය ප්‍රගාමී ගිවිසුම් - නිෂ්පාදන පිරිවැය

මෙම ලේඛනය මගින් විදේශ විනිමය ප්‍රගාමී ගිවිසුම්වල යෙදී සිටීම සම්බන්ධයෙන් වූ ප්‍රධාන තොරතුරු ඔබ වෙත සපයනු ලබයි. නිෂ්පාදනයේ ස්වභාවය, අවදානම්, පිරිවැය සහ නිශ්චිත නියාමන ආකෘතිය හඳුනාගැනීම සඳහා ඔබට සහායවීම පිණිස 2018 අංක 4 දරන බැංකු පනත් විධානය මගින් නියම කර ඇති ආකාරයට මෙම නිෂ්පාදන පත්‍රිකාව ඔබ වෙත පිරිනමනු ලැබේ. බැංකුව සමඟ යම් විදේශ විනිමය ප්‍රගාමී ගිවිසුමකට ඇතුළත්වීමට පෙරාතුව ඔබ විසින් නිෂ්පාදනය පිළිබඳව සම්පූර්ණයෙන් දැනුවත්වීම අනිවාර්ය වේ.

**කරුණාකර නිෂ්පාදනයේ අන්තර්ගතය කියවා අවබෝධ කරගන්න. ඔබට යම් පැහැදිලි කරගැනීම් හෝ අතිරේක තොරතුරු දැනගැනීමට අවශ්‍ය වේ නම්, +94112446994 දරන දුරකථන අංකය ඔස්සේ කරුණාකර නැෂනල් ඩිවලොප්මන්ට් පීඑල්සී ආයතනයේ භාණ්ඩාගාර අංශය හෝ ඔබගේ සම්බන්ධතා කළමනාකරු හෝ ශාඛා කළමනාකරු අමතන්න, නැතහොත් Treasury@ndbbank.com යන විද්‍යුත් ලිපිනය වෙත ඒ පිළිබඳ විද්‍යුත් තැපෑලෙන් විමසන්න.**

## මූලික නිෂ්පාදන තොරතුරු

| වර්ගය | ව්‍යුත්පන්න - විදේශ විනිමය ප්‍රගාමී ගිවිසුම (FXගිවිසුම)/විදේශ විනිමය SWAPS |
|---|---|
| අරමුණ | මෙම නිෂ්පාදන සේවයේ අරමුණ වනුයේ අනාගත කල් අවසන්වන දිනයක දී පූර්වයෙන් එකඟ වූ අනුපාතිකයක් යටතේ ව්‍යවහාර මුදල් ඒකක දෙකක් අතර විදේශ විනිමය (FX) ව්‍යවහාර මුදල් අනුපාතිකවල සිදුවන අහිතකර සංචලනයන්ට එරෙහිට ආරක්ෂාවක්/ඇවුරුමක් සැපයීම වේ.<br><br>**ප්‍රගාමී ගිවිසුමක් යනු එකඟ වූ අනාගත දිනයක දී එකඟ වූ අනුපාතිකයක් යටතේ ව්‍යවහාර මුදල් ඒකක දෙකක නිශ්චිත මුදලක් හුවමාරු කිරීම සඳහා සේවාදායක සහ නැෂනල්** |

**ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (NDB) අතර ඇතිවූ බැඳීම් සහගත ගිවිසුමක් වේ.**

**"ප්‍රගාමී අනුපාතිකය"** යනුවෙන් ද හඳුන්වනු ලබන ගිවිසුම් හුවමාරු අනුපාතිකය සඳහා ප්‍රගාමී ගිවිසුම වෙන් කිරීමේ/ එම ගිවිසුමට එකඟ වීමේ අවස්ථාවේ දී එකඟවනු ලැබේ. ප්‍රගාමී අනුපාතිකය, නිශ්චිත ව්‍යවහාර මුදල් ඒකක දෙක අතර පවතින පොලී අනුපාතික වෙනසින්, ගණනය කරනු ලබන ස්ථානීය අනුපාතිකයට ප්‍රගාමී හුවමාරු ඒකක එකතුකිරීම හෝ අඩුකිරීම මත පදනම්ව ගණනය කරනු ලැබේ.

ප්‍රගාමී ගිවිසුම් වර්ග දෙකක් ඇත; එනම්,

- ස්ථාවර ප්‍රගාමී ගිවිසුම් :- නිශ්චිත පූර්වයන් එකඟ වූ අනාගත දිනයක දී මුදල් ආපසු ලබාගැනීම සිදුවීමට නියමිත වන අවස්ථාවක දී, පූර්වයන් එකඟ වූ දිනයට පෙරාතුව යම් අඩුකිරීමක් සිදුවන අවස්ථාවක දී, ගනුදෙනුකරුට පාඩුවක් සිදුවන පරිදි එකඟ වූ අනුපාතිකය සංශෝධනය කිරීමට සිදුවනු ඇත.

- කාලීන විකල්ප ප්‍රගාමී ගිවිසුමේ :- එක් හෝ වැඩි අඩුකිරීම් සිදුවීමේ දී නිශ්චිතව අනාගත දින දෙකක් අතර අඩුකිරීම් සිදුවිය හැකි වේ.

FX ගිවිසුමට එකඟ වී ඇති අවස්ථාවක දී, පාර්ශ්ව දෙකම ගිවිසුම්ගත එකඟත්වයකින් බැඳී සිටින අතර ඒ අනුව පශ්චාත් වාසිදායක හුවමාරු අනුපාතික චලනයක් මගින් වාසි ලබාගත නොහැකි වේ. ස්ථානීය අනුපාතිකය කල්පිරීමේ අවස්ථාව නොසලකා හරිමින් අනුපාතිකය භාවිත කිරීමට ඔබ

| | |
|---|---|
| | බැඳී සිටියි. කල්පිරීමේ දී ගිවිසුම්ගත මුදලින් 100%ක්ම ආරක්ෂිත වේ. අනුකූලව ක්‍රියා නොකිරීමක් හෝ අනපේක්ෂිත සිදුවීම් හේතුවෙන් ගිවිසුම අවලංගු කිරීමක් මගින් ඔබට සලකිය යුතු පාඩු ඇතිවිය හැකි ය. |
| **අර්පනය** | මෙම නිෂ්පාදන සේවා ශ්‍රී ලංකා මහබැංකුව විසින් අවසර දෙනු ලබන නිශ්චිත ගනුදෙනු සම්බන්ධයෙන් නැෂනල් ඩිවලොප්නමන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ සියලු සේවාදායකයන් සඳහා පිරිනමනු ලැබේ.<br><br>ජංගම ගිණුම් ගනුදෙනු සහ අවසරලත් ප්‍රාග්ධන ගනුදෙනු ඇතුළත් වන වලංගු නිශ්චිත ගනුදෙනු මත සේවාදායකයන් විසින් ඇතුළත් වන සියලු ව්‍යුත්පන්න පදනම් විය යුතු ය.<br><br>උදා:- වෙළඳ ගනුදෙනු (ආනයන/අපනයන), විදේශ ව්‍යවහාර මුදලින් විස්තර කරන වත්කමක් මිලදීගැනීම හෝ විකිණීම.<br><br>**සියලු බැංකු සමග සිදුවන ව්‍යුත්පන්න ගනුදනුවල සමස්ථ එකතුව, යම් දෙන ලද අවස්ථාවක දී සිදුවන නිශ්චිත ගනුදෙනු නිරාවරණය හෝ වටිනාකම නොඉක්මවන බවට සේවාදායක විසින් සහතික විය යුතු ය.**<br><br>**විදේශ විනිමය ප්‍රගාමී ගිවිසුමකට ඇතුළත්වීමට පෙරාතුව නිශ්චිත වලංගු ගනුදෙනුවක් පිළිබඳ විස්තර සහ තහවුරුකිරීමේ ලේඛන ලබාගැනීම සහ ශ්‍රි ලංකා මහ බැංකුවේ පවත්නා මාර්ගෝදේශවලට අනුව නිශ්චිත ගනුදෙනුව වෙන් කිරීම සඳහා අවසර ලබාදෙන බව තහවුරු කිරීම වැදගත් වේ.** |

| | |
|---|---|
| **කාලය සහ අවසරලත් ව්‍යවහාර මුදල්** | ශ්‍රී ලංකා රුපියල් (ශ්‍රී.ල.රු.) ඇතුලු ශ්‍රී ලංකා මහබැංකුව විසින් නම් කරනු ලබන සියලු ප්‍රධාන ව්‍යවහර මුදල් යුගලවලින් විදේශ විනිමය ප්‍රගාමී ගිවිසුම් වෙන්කරනු ලැබිය හැකි ය.<br><br>**සියලු ප්‍රගාමී ගිවිසුම් මුදල් දිනයකට වැඩි (උදා: එක් (1) ගිවිසුම් දිනයක්) සාමාන්‍යයෙන් අවුරුද්දක් දක්වා වන කාලසීමාවක් සඳහා වෙන්කරනු ලැබිය හැකි ය. එසේ වුවද, සේවාදායක අවශ්‍යතාවය, බැංකුවේ අවදානම් නැඹුරුතාව සහ වෙළඳපල ද්‍රවශීලතාවය මත පදනම්ව මෙම කාලසීමාව අවුරුදු 5ක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි ය. ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳපල සාමාන්‍යයෙන් එක් අවුරුද්දක් දක්වා ද්‍රවශීලවන අතර අත්‍යවශ්‍යයෙන්ම සියලු ගනුදෙනු අවුරුදු 1ක කාලසීමාවක් ඇතුළත සිදුකරනු ලබයි.**<br><br>**විදේශ විනිමය ප්‍රගාමී ගිවිසුම්වලට ඇතුළත්වීමට පෙරාතුව, සේවාදායකයන් විසින් බැංකුව සමඟ පවතින ප්‍රගාමී විනිමය ගිවිසුම් පිළිබඳ සීමාවක් ස්ථාපිත කිරීමට නියමිත වේ. අවශ්‍ය වන ආන්තිකය/සීමාවන් වනුයේ සේවා දායකයා සහ නිශ්චිතව දක්වනු ලබන ගනුදෙනු විශේෂය වේ.** |
| **ලිපිලේඛන අවශ්‍යතාවය** | - ව්‍යුත්පන්න ගනුදෙනු පිළිබඳ යථාපරිදි අත්සන් කරන ලද ගනුදෙනුකාර ගිවිසුම සහ නිෂ්පාදන සේවා පත්‍රිකාව ප්‍රතිග්‍රහණය කිරීම (නිෂ්පාදන සේවා අවබෝධකර ගැනිමේ ප්‍රකාශය)<br>- ප්‍රගාමී ගිවිසුම් ඉල්ලීම (ආයතනික නොවන සේවාදායකයන්)<br>- වලංගු නිශ්චිත ගනුදෙනු තහවුරුකිරීම් ලේඛන<br>- ප්‍රගාමී සීමාවක් ඇතිකිරීම |

| | |
|---|---|
| | - ප්‍රගාමී සීමාවන් ඇති කිරීම<br>- යථාපරිදි අත්සන්කරන ලද ගිවිසුම් ප්‍රතිග්‍රහණය කිරීම |
| ගිවිසුමක් අවලංගු කිරීම | FX ගිවිසුම් අවලංගු කිරීම සඳහා අනුබල දෙනු නොලැබේ. එසේ වුවද, අනපේක්ෂිත අවස්ථානුගත කරුණු/වලංගු හේතු අනුව අවලංගුකිරීම් සඳහා ඉඩ සලසනු ලැබිය හැකි ය.<br>(උදා- දේශාන්තර සැපයුම්කරු/ගැනුම්කරු විසින් යනාදී වශයෙන් ගිවිසුම අවලංගුකිරීම)<br><br>**ගිවිසුම්ගත ප්‍රගාමී අනුපාතිකය සහ වර්තමානයේ බලපවත්වන මුදල් අනුපාතිකය අතර හුවමාරු අනුපාතිකයන්හි පවතින වෙනස තුලින් උපචිත වන හුවමාරු පාඩු බැංකුව විසින් සේවාදායකගෙන් අයකරනු ලබයි. එසේ වුවද, කිසිදු ඉපයීමක් සේවා දායක වෙත යොමු කරනු නොලැබේ.** |
| ගිවිසුමක් දීර්ඝ කිරීම | අනපේක්ෂිත ප්‍රමාදයක් හේතුවෙන් ගිවිසුම්ගත එකඟතාවක් සපුරාලීමට නොහැකි වීම හේතුවෙන් ගිවිසුම අනාගත දිනයක් දක්වා ගිවිසුම දීර්ඝ කිරීමට ඔබට අවශ්‍යවන අවස්ථාවක දී, තත්කාලයේ බලපවත්නා වෙළඳපළ අනුපාතික මත පදනම්ව අලුත් ගිවිසුමක් උත්පාදනය කරනු ලබන අතර නිශ්චිතව දක්වන ව්‍යවහාර මුදල් ඒකක දෙකක් අතර පොළී අනුපාතික වෙනස මගින් ගණනය කරනු ලබන ස්වකීය අනුපාතිකයට ප්‍රගාමී හුවමාරු ඒකක මත පදනම්ව අලුත් ප්‍රගාමී අනුපාතිකය ගණනය කරනු ලැබේ.<br><br>**ගෙවීමට හිඟව පවතින/කල් අවසන් වූ ගිවිසුමක් තත්කාලයේ බලපවත්නා මූල්‍ය අනුපාතිකය යටතේ අවලංගු කරනු ලබන** |

| | |
|---|---|
| | **අතර ගිවිසුම්ගත ප්‍රගාමී අනුපාතිකය සහ තත්කාලයේ බලපවත්නා මූල්‍ය අනුපාතිකය අතර පවතින විනිමය අනුපාතිකවල වෙනස තුලින් උපචිත වන විනිමය ඉපයීම් හෝ පාඩු සේවාදායකගෙන් අයකිරීම හෝ සේවාදායක වෙත යොමුකිරීම කරනු ලැබේ.**<br><br>**ගිවිසුම අවලංගුකිරීමක් සිදු වන අවස්ථාවක දී, කලින් ගිණුමට බැරකර ඇති සියලු විනිමය ඉපයීම් ප්‍රත්‍යාවර්තනය කිරීම හෝ අයකර ගැනීම කරනු ලැබේ.** |
| අවදානම | ගෝලීය සහ ශ්‍රී ලංකා විදේශ විනිමය වෙළඳපලවල් ඉහළ අවදානමට නිරාවරණය වන සේවාදායකයන් විසින් අවදානම අවමකර ගැනීම පිණිස විදේශ විනිමය ප්‍රගාමී වෙන්කිරීම්වල ආවරණයන්හි යෙදී සිටීමට තීරණය කරනු ලැබිය හැකි ය.<br><br>එසේ වුවද, එකඟ වී සිටින අවස්ථාවක දී, ප්‍රගාමී ගිවිසුමක් යනු එකඟ වූ අනාගත දිනයක දී එකඟ වූ අනුපාතිකයක් යටතේ ව්‍යවහාර මුදල් වර්ග දෙකක නිශ්චිත මුදලක් හුවමාරුකිරීම සඳහා සේවාදායක සහ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය අතර පවතින බැඳීම් සහගත ගිවිසුමක් වේ.<br><br>එමනිසා, ගිවිසුම භාරගැනීමේ අවස්ථාවේ දී පැවතී වෙළඳපල අනුපාතිකය නොසලකා හරිමින් සේවාදායක විසින් ගිවිසුම භාර ගැනීමට බැඳී සිටියි.<br><br>**ගිවිසුම්ගත අනුපාතිකය සහ තත්කාලයේ බලපවත්නා වෙළඳපල අනුපාතිකය අතර පවතින වෙනස තුලින් උපචිත වන පාඩුව සේවාදායකගේ ගිණුමට බැරකරනු ලබන බැවින්,** |

| | |
|---|---|
| | **ගිවිසුම අවලංගු කිරීමක් මගින් සේවාදායක වෙත බරපතල පාඩු විඳීමට සිදුවිය හැකි ය.** |
| ගාස්තු/පිරිවැය | ප්‍රගාමී හුවමාරු ගිවිසුම් ස්ථාපිත කිරීම සඳහා නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය විසින් අතිරේක ගාස්තු අයකරනු නොලැබේ. |
| පාලනය වන නීතිය/නියෝග | ශ්‍රී ලංකාවේ නීතිය සහ ශ්‍රී ලංකා මහබැංකුව |
| ලේඛනය නිකුත් කිරීමේ දිනය | 2018 නොවැම්බර් මස 1 |

**නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී**
තැපැල් පෙට්ටිය 1825
40, නවම් මාවත
කොළඹ 2
ශ්‍රී ලංකාව
දුරකථන අංකය; +94112448448
ෆැක්ස් අංකය; +94112440262
විද්‍යුත් ලිපිනය; contact@ndbbank.com
වෙබ් අඩවිය; www.ndbbank.com